## දරුවන් උදෙසා බයිබලයක්



# දාවිත් නම්වූ රජතුමා (දෙවන කොටස)

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Lazarus
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

දාවිත් දකුණු ඊශ්‍රායලයේ
ජුදාහි රජු වූයේය. නමුත්
ඉශ්‍රායෙල්හි සෙසු පළාත්
වලට සාවුල්ගේ පුත්
ඉෂ්බෝෂෙත්ව රජු
ලෙස එරට ජනතාව
පිළිගත්තෝය. වසර
හතක් පුරා සිවිල්
යුද්ධය ඇවිළී
ගියේය. නමුත්
දාවිත් වඩ
වඩාත්
ශක්තිමත්
වූයේය.



අවසානයේදී ඉෂ්බෝෂෙත් රජුව ඔහුගේම සොල්දාදුවන් දෙදෙනෙකු විසින් මරා දමන ලදී.



ඉන්පසු ඉශ්‍රායෙල්හි සියලු ගෝත්‍ර දාවිත් වෙත පැමිණ ඔහුව ඊශ්‍රායෙල්හි රජු ලෙස අභිෂේක කළෝය. අවසානයේදී දාවිත් මුළු දේශයටම රජ වූයේය.



දාවිත් රජු කළ පළමු දෙය නම් ජෙරුසලම අල්ලා ගැනීමයි. එය දාවිත්ගේ නගරය ලෙස ප්‍රසිද්ධ විය. ඔහු සතුරන්ට එරෙහිව බලකොටුවක් ලෙස එය නැවත ගොඩනගා ගත්තේය. ජෙරුසලමේ සිට, දාවිත්ගේ හමුදාව පිලිස්තිවරුන් සහ ඊශ්‍රායෙලයේ අනෙකුත් සතුරන්ව පරාජය කිරීමට පිටත් විය.



ඉන්පසු දාවිත් රජ දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ආවේය. දෙවියන් වහන්සේගේ කරඬුවේ දෙවියන් වහන්සේ විසින් මෝසෙස්ට දෙන ලද ආඥා දහයේ සහ වෙනත් නීතිවල පිටපත් අඩංගුව තිබුණේය.



ගිවිසුම් කරඬුව, ඊශ්‍රායෙල්වරුන්ට දෙවියන් වහන්සේගේ ශුද්ධකම ගැනත් උන්වහන්සේට කීකරු වීමේ අවශ්‍යතාව ගැනත් මතක් කර දුන්නේය.



දාවිත්ට ඔහුගේ පාලන
සමයේ මුල් කාලයේදී
බොහෝ සටන් කිරීමට
සිදු විය. ඔහු ප්‍රඥාවන්ත
සොල්දාදුවෙක් මෙන්ම
දෙවියන් වහන්සේගේ
මඟ පෙන්වීම් ඉල්ලා
යාච්ඤා කළ නිහතමානී
පුද්ගලයෙකු වූයේය.



දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව
කූඩාරමක තිබියදී ඔහුට
ජීවත් වීමට මනහර නිවසක්
තිබීම ගැන දාවිත්ගේ
සිත දොස් කීවේය.
දාවිත් දේවමාළිගාවක්
ගොඩනැඟීමට තීරණය
කළේය. දෙවියන්
වහන්සේගේ
අනාගතවක්තෘ වූ
නාතාන් ඔහුට ඒ
කාර්යය කරන
මෙන් අවවාද
දුන්නේය.



එදින රාත්‍රියේ
දෙවියන්
වහන්සේ
දාවිත්ට
පණිවිඩයක් එවූ
සේක: “මාගේ
මෙහෙකරු වූ
දාවිත්, සමිදාණන්
වහන්සේ ඔබට
ගෘහයක් සාදන සේක.
ඔබේ දවස් සම්පූර්ණ වී ඔබේ
පියවරුන් සමඟ ඔබ විවේක ගත් විට, මම ඔබේ දරුවා ඔබට
පසුව රජු ලෙස පත් කරන්නෙමි. ඔහු මාගේ නාමයට
ගෘහයක් ගොඩනඟනු ඇත. මම ඔහුගේ රාජ්‍යයේ
සිංහාසනය සදහටම පිහිටුවන්නෙමි.”

සාවුල්ගේ පවුලේ දිවි ගලවා ගත් ඕනෑම කෙනෙකුට උපකාර කිරීමට දාවිත්ට අවශ්‍ය වූයේය. ඔහුට හමුවූයේ ආබාධිත වූ ජොනතන්ගේ පුත් මෙපිබොෂෙත් පමණි. “ඔහු රජුගේ පුත්‍රයන්ගෙන් කෙනෙකු මෙන් මාගේ මේසයෙන් කෑම ගනු ඇත” යි දාවිත් කීවේය. ජොනතන් ඔහුගේ හොඳම මිතුරාව සිටි නිසා දාවිත් මෙපිබොෂෙත්ට කරුණාව දැක්වූයේය.





දාවිත් දෙවියන් වහන්සේව විශ්වාස කර උන්වහන්සේට කීකරුව සිටි තාක්කල්, දෙවියන් වහන්සේ ඔහුට සමෘද්ධිමත් වීමට උදව් කළ සේක. නමුත් දිනක් දාවිත්ගේ ජීවිතයට දරුණු සෙවනැල්ලක් වැටුණේය. ඔහු තම හමුදාව යුද්ධයට යවා යෙරුසලමේ නැවතී සිටියේය. එක් රාත්‍රියක ඔහුට නිදාගන්නට නොහැකි විය. එහෙයින් ඔහු පියස්සට නැග නගරය අවට බැලුවේය.

දාවිත් රූමත් කාන්තාවක් නානවා දුටුවේය. ඇගේ නම බැත්ෂෙබාය. දාවිත් බැත්ෂෙබා සමඟ පව් කළේ ඇගේ සැමියා වූ උරියා දාවිත්ගේ නිර්භීත සොල්දාදුවෙකු වී සිටියදීය. බැත්ෂෙබා පසුව දාවිත්ට තම දරුවා ලැබීමට යන බව පැවසූ විට, ඔහුගේ පාපය තවත් ගැටළු ඇති කරන බව දාවිත් දැනගත්තේය.







දෙවියන් වහන්සේට
තමා කළ පාපය ගැන
පාපොච්චාරණය කරනවා
වෙනුවට ඔහුගේ පාපය වසා ගැනීමට දාවිත් උත්සාහ
කළේය. එය කිසි විටෙකත් සාර්ථක නොවේ! ඔහු උරියාව
යුධ පිටියේ සිට නිවසට කැඳවා ගත්තේ, උපදින්න නියමිත
දරුවා තමාගේ යැයි උරියා සිතනු ඇතැයි යන අපේක්ෂාවෙනි.
නමුත් ඔහුගේ සෙසු සොල්දාදුවන් යුද්ධයක යෙදී සිටියදී
උරියා නිවසේ ජීවත් වන්නට අකමැති වූයේය. උරියා,
රජුගේ ගෘහයේ දොරකඩ නිදාගත්තේය.

එහෙයින් දාවිත් ඊටත් වඩා නපුරු දෙයක් කළේය. ඔහු ලිපියක් සමඟ උරියා නැවත යුද බිමට යැවීය. උරියා සටනේදී මිය ගිය බව සහතික කරන ලෙස සෙන්පතියාට එම ලිපියෙන් දන්වා යැව්වේය. උරියා යුද්ධයේදී මියගිය විට දාවිත් බැත්ෂෙබාව තම බිරිඳ කරගත්තේය.



දෙවියන් වහන්සේ ඔහුගේ සේවකයා වන නාතාන්ව දාවිත්ට ඔහුගේ පාපය පෙන්වා දීමට එව්වේය. නාතන් දාවිත්ට පැවසුවේ ධනවත් මිනිසෙකු සහ ඉතා දුප්පත් මිනිසෙකු පිළිබඳ කතාවකි. ධනවතාට බැටළුවන් සිය ගණනක් විය. නමුත් දුප්පත් මිනිසාට සිටියේ එකම කුඩා බැටළු පැටවෙකු වන අතර ඔහු ඒ බැටළු පැටවා දියණියක මෙන් අගය කළේය.



ධනවතා වෙතට අමුත්තෙකු පැමිණි විට ඒ ධනවතා ඔහුට කෑමට දෙනු පිණිස ඔහුගේ එක බැටළුවෙකුවත් නොමරා ඒ වෙනුවට දුප්පතාගේ බැටළු පැටවා රැගෙන මරා දැමුවේය.





ධනවතාගේ
ආත්මාර්ථකාමිත්වය
ගැන දාවිත් කෝප
වූයේය. “මෙය කළ
මිනිසා නියත වශයෙන්ම
මිය යනු ඇත” කියා ඔහු
කෑගැසුවේය.

“ඔබයි ඒ මිනිසා!” නිර්භීත නාතාන් දාවිත්ට කීවේය. කතාවේ ධනවතා කළ දේට වඩා දාවිත් කළ දේ වඩාත් නරකය.



දෙවියන් වහන්සේ දාවිත්ට ඔහු කෙතරම් දුෂ්ඨද යන වග පෙන්වූ සේක. දාවිත් තමා කළ පාපය ගැන කණගාටු වූයේය. ඔහු දෙවියන් වහන්සේට “ඔබට විරුද්ධව මම පව් කර මේ නපුර කළෙමි” යි කීවේය. දෙවියන් වහන්සේ දාවිත්ගේ පාපයට සමාව දුන් සේක. නමුත් බැත්ෂෙබාගේ දරුවා ඉතා අසනීප වූ අතර ඉපදුන ඉක්මනින්ම මිය ගියේය.





දෙවියන් වහන්සේ දාවිත්ට
ඔහුගේ දරුණු පාපයට සමාව දුන්
සේක. ඉන්පසු බැත්ෂෙබාට තවත්
දරුවෙකු ලැබුණි. ඒ, දාවිත්ගෙන්
පසු ශ්‍රේෂ්ඨ රජෙකු වීමට
නියමිතව සිටි සලමොන්ය. නමුත්
දාවිත් රජුට තවත් බොහෝ
දරුවන් සිටි අතර ඔවුහු
සමහරෙක් ඔහුට මහත් දුක්
ගෙන දුන්නෝය.

දාවිත් නම්වූ රජතුමා (දෙවන කොටස)

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

2 සාමුවෙල් 1-12

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)